රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2015

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය පරිපාලන සහ
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.12.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

<u>වැඩ වසර ඇරඹීම - 2016</u>

ශ්‍රී ලාංකික ජනතාවට නව ආර්ථික හා සමාජීය මංපෙත් විවර කරමින් අදට වඩා හොඳ හෙට දිනක් නිර්මාණය කිරීම සඳහා වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් සියලුම රාජ්‍ය සේවකයන් තුළ ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 2016 වසරේ වැඩ කරන පළමු දිනය වන 2016 ජනවාරි මස 01 වන සිකුරාදා සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මැනවි.

02. එහි ප්‍රධාන නිල උත්සවය ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එදින පෙ.ව.9.00ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වේලාවටම මෙම වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලුම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ යොදා ගත යුතු වේ.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම. (සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් එක් තැනකට ඒකරාශී කරවීමට බාධා පමුණුවන ඉඩකඩ පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත් සෑම සාමාජිකයෙකුගේම සහභාගිත්වය සහතික කෙරෙන පරිදි සුදුසු විකල්ප වැඩපිළිවෙළක් යොදා ගත හැකි ය.)

II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු දෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

IV. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් (මේ සමඟ එවා ඇති) රාජ්‍ය සේවා ප්‍රතිඥාව/දිවුරුම හඬනගා කියවීම.

V. මෙම වැඩපිළිවෙළෙහි අවසාන අංගය ලෙස ආයතනයේ ප්‍රධානියා විසින්, ශ්‍රී ලාංකික ජනතාවට නව ආර්ථික හා සමාජීය මංපෙත් විවර කරමින් අදට වඩා හොඳ හෙට දිනක් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා කාර්ය මණ්ඩලයේ සෑම දෙනාගේම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමකින් යුතුව ලබා දීමේ අවශ්‍යතාව තේමා කර ගත් කෙටි දේශනයක් පැවැත්වීම.

03. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ජේ.දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

## රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/දිවුරුම

වර්ෂ දෙදහස් දහසයක් වූ ජනවාරි මස පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ලක්වැසි ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කරන

නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන මාතෘ භූමිය

සංවර්ධනය කිරීමේ දැවැන්ත අභියෝගය ජයගැනීම සඳහාත්

ශ්‍රී ලාංකික ජනතාවට නව ආර්ථික හා සමාජීය මංපෙත් විවර කරමින්

අදට වඩා හොඳ හෙට දිනක් නිර්මාණය කිරීම සඳහාත්

මහජන මුදලින් වැටුප් ලබන රාජ්‍ය සේවකයෙක් වන මම,

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/දිව්රුම් දෙමි.